000043

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2015/2016

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2018 ජුනි/ ජූලි)

## BLE 207 (a) - වාණිජ නීතිය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**01.** “1890 හවුල් ව්‍යාපාර පනතේ පළමුවැනි (01) වගන්තියට අනුව පුද්ගලයන් පිරිසක් අතර ලාබය අපේක්ෂාවෙන් පවත්වාගෙන යන පොදු ව්‍යාපාර සම්බන්ධතාවක් හවුල් ව්‍යාපාරයක් වන්නේය.”

මෙකී ප්‍රකාශයෙහි පිහිටා හවුල් ව්‍යාපාරයක නෛසර්ගික ලක්ෂණ, අධිකරණ තීරණ සමඟින් විස්තර කරන්න.

**(ලකුණු 20)**

**02.** (අ) 1890 හවුල් ව්‍යාපාර පනත අනුව හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් අධිකරණ තීරණ සමඟින් කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 15)**

(ආ) ජයන්ත සහ මයන්ත අතර පැවති හවුල් ව්‍යාපාර ගිවිසුමකට අනුව ජයන්තගේ පුතාවන අවන්තට වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ වූ විට ඔහු, ඔවුන්ගේ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වශයෙන් බඳවා ගැනීමේ බලය හවුල් ව්‍යාපාර ගිවිසුම යටතේ ජයන්තට ලබාදී තිබුණේය. අවන්තට වයස අවුරුදු දහඅට පිරුණු විට ජයන්ත විසින් ඔහු හවුල්කරුවකු වශයෙන් බඳවා ගන්නා ලදී. එවිට මයන්ත ඊට විරුද්ධවිය. එබැවින් සිය පුතා හවුල් ව්‍යාපාරයට බඳවා ගැනීමට අවසර ලබා ගැනීම පිණිස අධිකරණය ඉදිරියේ නඩු පැවරීමට ජයන්ත අපේක්ෂා කරයි. ජයන්තට උපදෙස් දෙන්න.

**(ලකුණු 05)**

**03.** (අ) අනුමැතික නියොජ්‍යත්වය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? එය සුදුසු නිදර්ශන සමඟින් පැහැදිලි කරන්න.

**(ලකුණු 15)**

(ආ) ධනසිරි ස්ටෝර්ස්හි කළමණාකරු වශයෙන් මධුක නැමැත්තා සේවය කළ අතර පුරුද්දක් වශයෙන් සව්සිරි ස්ටෝර්ස් වෙතින්, ඔහු විසින් ලබාගත් භාණ්ඩ වල මිල, ධනසිරි ස්ටෝර්ස් හි අධිපති ධනපාල මහතා විසින් සව්සිරි ස්ටෝර්ස් වෙත ගෙවීය. පසුව මධුක සව්සිරි ස්ටෝර්ස් වෙත ගොස් සුපුරුදු භාණ්ඩ තොගයක්ම ණයට මිලදී ගෙන ඒවා රැගෙන පලා ගියේය. එබැවින් සව්සිරි ස්ටෝර්ස් විසින් ධනපාල මහතාට විරුද්ධව සිය මුදල් ඉල්ලා නඩු පැවරීය.

සව්සිරි ස්ටෝර්ස් ඔබගේ උපදෙස් පතයි. එයට උපදෙස් දෙන්න.

**(ලකුණු 05)**

**04.** අධිකරණ තීරණ සමඟින් නියෝජිතයාගේ යුතුකම් සහ අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

05. "ගිවිසුමක් යනු එහි පාර්ශවකරුවන් අතර නෛතික බැඳීමක් ඇති කරන හෝ ඇති කිරීමට අදහස් කරන ලද එකඟත්වයකි."

මෙකී ප්‍රකාශයෙහි පිහිටා පාර්ශවයන් අතර ගිවිසුමක් ඇති කිරීම පිළිබඳ නීතිය කෙටියෙන් සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

06. (අ) "චෙක්පත් රේඛණය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

1927 අංක 25 දරන විනිමය බිල්පත් ආඥා පනතේ අදාළ නෛතික විධිවිධාන සහ අධිකරණ තීරණ ඇසුරින් චෙක්පත් රේඛණය හා අදාළ නීතිය විස්තර කරන්න.

**(ලකුණු 15)**

(ආ) වසන්ත විසින් චෙක්පතක් අත්සන් කොට එය "ගනුදෙනු කළ නොහැක" යනුවෙන් රේඛණය කොට ආදායම් බදු ගෙවීම පිණිස එකී චෙක්පත රුපියල් පනස්දාහකට (රු. 50000/=) සකස් කරන මෙන් ඔහුගේ ලිපිකාරිනිය වූ සමන්තාට නියෝග කළේය. සමන්තා විසින් එය රුපියල් පනස්දාහකට (රු. 50000/=) සකස් කොට ඇගේ පෞද්ගලික ණයක් ගෙවීම සඳහා ප්‍රියන්තිට දුන්නාය. ප්‍රියන්ති විසින් චෙක්පතේ මුදල ලබා ගැනීමෙන් පසු වංචාව හෙළිවිය. එබැවින් වසන්ත විසින් ප්‍රියන්තිට විරුද්ධව චෙක්පතෙහි මුදල ලබා ගැනීම පිණිස නඩු පැවරුවේය. ප්‍රියන්ති ඔබගේ උපදෙස් පතයි. ප්‍රියන්තිට උපදෙස් දෙන්න.

**(ලකුණු 05)**

07. පහත සඳහන් අධිකරණ තීරණ කෙටියෙන් විස්තර කර ඒවා හා අදාළ නීතිය සාකච්ඡා කරන්න.

(අ) කාර්ලයිල් V කාබොලික් ස්මෝක්බෝල් සමාගම

(ආ) ස්ප්‍රින්ගර් V ජී. ඩබ්. රේල්වේ සමාගම

**(එකකට ලකුණු 10 බැගින්)**

08. පහත සඳහන් ඒවායින් <u>ඕනෑම දෙකක් (02)</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) සමාගමක නම පිළිබඳ නීතිය;

(ආ) භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ දැක්වෙන කොන්දේසි;

(ඇ) රක්ෂණ ගිවිසුමක මූලික අංග.

**(ලකුණු 20)**

***********************